# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය
கிராமப்புற மேம்பாடு , சமூக பாதுகாப்பு மற்றும் சமூக அதிகாரமளித்தல்
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය
எனது DSD/HO/05/08/01/චක්‍රලේඛ ... ........................................................

ඔබේ අංකය
உமது இல ..........................................
Your No

...ගය
...கதி 2024.12.18
...ate

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක:- 2024/15**

**සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු හා සමෘද්ධි බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,**

**සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති හා ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් වෙත.**

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති /ප්‍රජාමූල බැංකු වල විධායක කමිටු හා , පාලක මණ්ඩල සාමාජික සංඛ්‍යාව තීරණය කිරීම.</u>

අංක 2009/08 හා 2017 මාර්තු මස 07 දින නිකුත් කල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් සමෘද්ධි නියෝග අනුව සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල පාලක මණ්ඩල හා විධායක කමිටු පත්කිරීම,පාලක මණ්ඩලයේ හා විධායක කමිටුවේ සමාජික සංඛ්‍යාව තීරණය කිරීම, ධූර කාලය හා ඉවත් කිරීම, ඉල්ලා අස්වීම පිලිබඳව නිශ්චය කිරීමේ බලය ඇත්තේ 2013 අංක 01 දරන සමෘද්ධි පනතේ 34 වගන්තිය යටතේ පිහිටවූ සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහ සංගමයට වේ.

ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමෘද්ධි බැංකු සමිති හා සමෘද්ධි බැංකුවල සාමාජික සංඛ්‍යාව, පිලිබඳව පහත සඳහන් තීරණ ලබාදුන් අතර එම තීරණයන් 2025 ජනවාරි 01 වෙනි දින සිට ක්‍රියාත්මක කල යුතුවේ.

(1) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා පාලක මණ්ඩල සමාජිකයින් පත්කිරීමේදී අදාල බැංකු බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාවට සමාන සාමාජිකයන් සංඛ්‍යාවක් පත්කර ගත යුතුවේ. උදාහරණයක් ලෙස සමෘද්ධි බැංකු බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව 09 යක් වේ නම් සභාපති ඇතුළු පාලක මණ්ඩල සාමාජික සංඛ්‍යාව 09 කි.ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව 16 ක් වේ නම් පාලක මණ්ඩල සාමාජික සංඛ්‍යාව 16 කි. උපරිම සාමාජික සංඛ්‍යාව සමෘද්ධි බැංකුවට අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාවට සමාන වේ.

එසේම සමෘද්ධි බැංකු පාලක මණ්ඩලයට සිටිය යුතු අවම සාමාජික සංඛ්‍යාව 07 කි. ඒ අනුව ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව 07 කට අඩුව පවතින සමෘද්ධි බැංකු විසින්ද, ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව නොසලකා අවම පාලක මණ්ඩල සාමාජික සංඛ්‍යාව වන 07 දෙනෙකු පත්කර ගත යුතුවේ. මෙහිදී සෑම සමෘද්ධි බැංකුවකටම මේ දක්වා පත්කරගත් 15 දෙනෙකුගෙන් යුත් පාලක මණ්ඩල සාමාජික සංඛ්‍යාව පිළිබඳව නොසලකා ඉහත පදනම මත සාමාජිකයන් පත්කර ගත යුතුය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battara**

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288'** |

(2) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවල විධායක කමිටු සමාජිකයන් පත්කිරීමේදි දැනට පවතින ක්‍රමයම ක්‍රියාත්මක කරන ලෙසත්, ඒ අනුව විධායක කමිටුවේ අවම සාමාජික සංඛ්‍යාව 07 ක් ලෙසත්, උපරිම සංඛ්‍යාව එම සමෘද්ධි බැංකු සමිතියට අයත් සමෘද්ධි බැංකු සංඛ්‍යාවට සමාන විය යුතුය.

සියළුම ප්‍රජාමූල සමෘද්ධි බැංකු හා බැංකු සමිති විසින් මෙම නිකුත් කල උපදෙස් අනුව ඉදිරි කටයුතු කල යුතු බව අවධාරණය කරමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

01. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වරුන් - කා .දැ හා අ. ක. ස
02. සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය - කා.දැ.ගැ.ස